**ශීර්ෂ 315 - උතුරු පළාත් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

උතුරේ ජනතාවගේ අපේක්ෂාවන් තෘප්තිමත් කිරීම උදෙසා යහපාලනය ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම මගින් ධරණීය සංවර්ධනය සහිතව සමෘද්ධිමත් බව ලබා කර ගැනීමට අරමුණු කර ගැනීම.

### 1.2 මෙහෙවර

ජීවනෝපාය නැවත පිහිටුවීම මගින් සේවා හා යටිතල පහසුකම් නැවත සක්‍රීය කිරීම සමග උතුරු පළාතේ ජනතාව ඉලක්ක කර ගනිමින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය හා මානව සම්පත් සංවර්ධනය.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදන හා ගිණුම**

උතුරු පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 25,240.24 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 23,791.27 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,448.97 ක් හෙවත් සියයට 5.74 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2017 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 17,077.53 | 17,077.53 | -- | -- |
| මූලධන | 8,162.71 | 6,713.74 | 1,448.97 | 17.75 |
| **එකතුව** | **25,240.24** | **23,791.27** | **1,448.97** | **5.74** |

## 3. විගණන නිරීක්ෂණය

පාර්ලිමේන්තුව විසින් ශීර්ෂය යටතේ ලබාදුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගණනය කරන ලද අතර ඒ අනුව උපයෝජනය කරන ලදී. පළාත් සභා අරමුදල පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.